# මූලික තොරතුරු ලේඛනය

**PMF FINANCE PLC**

**පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී**

පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි ගනුදෙනුකරුවන් හට සලසා දිය හැකි නිමැවුම්හි ලක්ෂණ සම්බන්ධව විස්තරයක් මෙම ලේඛණයේ අන්තර්ගතය. මෙහි අන්තර්ගත නියමයන්, කොන්දේසි සහ අදාලවන ගාස්තු සහ අයකිරීම්, ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමේ, නිශේධනය කිරීමේ (කපා හැරීමේ) හෝ එකතු කිරීමේ අයිතිවාසිකම, සමාගම සතුය. ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද මුල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි නියමානය පරිදි ගනුදෙනුකාරභවතුන්ගේ දැනගැනීම පිණිස මෙම මූලික තොරතුරු ලේඛනය පිළියෙල කරන ලදි.

pmf finance Fixed Deposits

For a Trustworthy Future...



**PMF ස්ථාවර තැන්පතු**

ඔබගේ අනාගත ස්ථායිතාවය, තහවුරු කරයි.

# මූලික තොරතුරු ලේඛනය

## ස්ථාවර තැන්පත්

1) **නිමැවුමෙහි ස්වභාවය**

- PMF ස්ථාවර තැන්පතු හොඳම විකල්පය වන අතර, ඔබ වෙහෙස මහන්සි වී උපයාගත් ඉපයීම් සඳහා, උපරිම ආරක්ෂාව සහ ප්‍රතිලාභ සහතික කරන නැණවත් ආයෝජනයකි.
- අනාගත ආයෝජකයන් වීමට අපේක්ෂිත ඔබට මාස 1 සිට මාස 60 දක්වා වූ කාල පරාසයන් සඳහා ස්ථාවර තැන්පත් ඇරඹිය හැක.
- කල්පිරීමේදී පොලී ගෙවනු ලබන, තැන්පතු සඳහා 90% දක්වා සහ මාසික පොලී ගෙවන තැන්පතු සඳහා 80% දක්වා කෙටිකාලීන ණය පහසුකමක්/ ඇපකර ලිපියක්, ස්ථාවර තැන්පතු පාරිභෝගිකයින්හට ලබා ගත හැක සහ ලේඛන ගාස්තු ලෙස පහසුකමකට රු. 1,500 ක් අය කෙරේ.

2) **මූල්‍ය ශක්තිය සහ අනෙකුත් ප්‍රතිලාභ**

- සීමාසහිත ස්ටර්ලිං කැපිටල් ඉන්වෙස්ට්මන් (පෞද්ගලික) සමාගමේ පරිපාලිත සමාගමක් වීම.
- 2011 වසරේ අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ අනුමත මූල්‍ය සමාගමක් වීම.
- කොළඹ කොටස් වෙළෙඳපළේ ලැයිස්තුගත සමාගමක් වීම.
- මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ 40 වසරක පළපුරුද්ද.
- ආකර්ෂණීය පොලී අනුපාත.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව.
- උපරිම සුරක්ෂිත බව.

3) **අවම ශේෂ අවශ්‍යතා, ගිණුම ආරම්භ කිරීමේ ගාස්තු, ගිණුම පවත්වා ගෙන යාමේ ගාස්තු, ගිණුම වැසීමේ ගාස්තු**

ගිණුමක් ආරම්භ කිරීමට රු.5,000/- ක් තැන්පත් කළ යුතුය. මෙම මූලික තැන්පත් මුදල විටින් විට, සමාගමේ අභිමතය පරිදි වෙනස් වීමකට ලක් කල හැකිබව කාරුණිකව සළකන්න.

**4) තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමය**

“ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ක්‍රියාත්මක කරන, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, සුදුසුකම් ලබන එක් තැන්පත්කරුවකුට රු.1,100,000/- ක උපරිමයක් දක්වා පදනම මත වන්දි ලබාගැනීමට හැකිවන පරිදි සුදුසුකම් ලබන තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.”

5) **අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්**

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද ස්ථාවර තැන්පත් සඳහා වූ අයදුම්පත.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේ පත. - KYC (Know Your Customer) form.

- ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද සත්‍ය පිටපතක්.
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

6) <u>**නියමයන් සහ කොන්දේසි**</u>

- කළමනාකරණ පාර්ශවයේ අභිමතයෙන් තොරව සහතිකයේ සඳහන් කාලසීමාව කල්පිරීමට ප්‍රථම ස්ථාවර තැන්පත් ගිණුමක මුදල් ආපසු ලබා ගත නොහැක.

- කල්නොපිරුණු ස්ථාවර තැන්පත් ගිණුමක මුදල් ආපසු ගැනීමකදී, පොලී අනුපාතිකය සකස් කළ යුතු අතර, සකස් කළ පොලීය ගණනය කර සමාගම සමඟ තැන්පතුව පැවති කාල සීමාව සඳහා පමණක් පොලීය ගෙවනු ලැබේ.

- කල් පිරෙන දිනට පෙර මුදල් ආපසු ගැනීම සඳහා අපහට පෙර දැනුවත් නොකරන අවස්ථාවන්හිදි, පවත්නා පොලී අනුපාත යටතේ තැන්පතුව සමාන කාල සීමාවක් සඳහා ස්වයංක්‍රීයව අලුත් කරනු ලැබේ. නව පොලී අනුපාතය සහ අලුත් කරන ලද තැන්පත් මුදල තහවුරු කරමින් අලුත් කිරීමේ දැන්වීමක්, සති දෙකක කාලයක් තුළ දැනුම් දෙනු ලැබේ.

- මුල් මුදල සහ උපචිත පොලීය ගෙවීම සඳහා තැන්පතුකරු/ තැන්පතුකරුවන් විසින් නිසි පරිදි පිටසන් කරන ලද මුල් තැන්පතු සහතිකය ආපසු භාර දිය යුතු අතර, කල් පිරෙන දිනට, දින හතකට පෙර සමාගමට දැනුම් දීම අවශ්‍ය වේ.

- බද්ධ තැන්පතු සම්බන්ධයෙන්, නිශ්චිත උපදෙස් ලබා නොදී ඇති අවස්ථාවක, මුල් මුදල සහ/හෝ පොලීය, ඕනෑම පාර්ශ්වයකට ආපසු ගෙවීම, සමාගමේ වගකීම් අවසාන සහ සම්පූර්ණ ලෙස ඉටු කිරීමක් වශයෙන් පිළිගැනෙන අතර ගෙවීම සඳහා ලබාගත් රිසිට්පත, ගෙවීම තහවුරු කරන වලංගු ප්‍රමාණවත් සාක්ෂියක් වශයෙන් පිළිගැනෙනු ඇත.

- දැනුම් දීමකින් තොරව, තැන්පතු මුදල ආපසු ගෙවීමේ අයිතිය, සමාගම සතුවන අතර, තැන්පතු මුදල, සමාගමේ ආයෝජනය කර ඇති කාලය සඳහා, සහතිකයේ දක්වා ඇති පොලී අනුපාතය, තැන්පත්කරුට ගෙවනු ලැබේ.

- බද්ධ තැන්පත් ගිණුමක නාමිකයන් නම්කර ඇති විටක, කල් පිරෙන අවස්ථාවේදි එක් තැන්පත්කරුවෙක් හෝ ජීවත්ව සිටීම, නාමිකයන් පත් කර තිබීමේ කාරණය බල රහිත කිරීමට හේතු කාරක වනු ඇත.

- බද්ධ තැන්පත්කරුවන්ගෙන් එක් කෙනෙකුගේ අභාවයකදි, සමාගම විසින් ගෙවා නිම කළ යුතු වගකීම් බැඳියාව, ජීවතුන් අතර සිටින තැන්පත්කරුට/ තැන්පතුකරුවන්හට ගෙවනු ලැබේ.

- තනි තැන්පතුකරුවෙකුගේ අභාවයකදී සමාගම විසින් ගෙවා නිම කළ යුතු වගකීම් බැඳියාව, ජීවතුන් අතර සිටින නාමික තැනැත්තාට/ තැනැත්තන්හට ගෙවනු ලැබේ.

- අස්ථානගත වූ හෝ විනාශ වූ තැන්පතු සහතිකයක් සම්බන්ධව දිවුරුම් ප්‍රකාශයක් සහ හානිපූරණ සහතිකයක් සමග සමාගම වෙත දැනුවත් කළ යුතුය.

- තැන්පතු සේවාවන් සඳහා අදාල වන පොලී අනුපාත අපගේ සියළුම ශාඛාවන්හි සහ අපගේ වෙබ් අඩවියේ සටහන් කර ඇත.

**7) <u>ක්‍රියා විරහිත (Inactive) සහ අක්‍රිය (Dormant) ගිණුම් හා සබැඳි, සමාගමේ ප්‍රතිපත්ති</u>**

ඉහත සඳහන් නියාමන අවශ්‍යතාවයට/"අක්‍රිය" (Dormant) ගිණුම් වර්ගීකරණය පිළිබඳ මාර්ගෝපදේශයට අනුකූලව ගනුදෙනුකරු ගනුදෙනුවලින් තොරව ගිණුම පවත්වා ගෙන ගිය කාලසීමාව මත, සමාගම අදියර දෙකකින් යුත් "අක්‍රිය" (Dormant) වර්ගීකරණයක් අනුගමනය කරනු ඇත.

1 වන අදියරය - "ක්‍රියා විරහිත" (Inactive) වශයෙන් ගිණුම් වර්ගීකරණය (ස්ථාවර ගිණුම් සහ ඉතිරි කිරිමේ ගිණුම් වලට අදාළවේ.) සියලුම ඉතිරි කිරීමේ ගිණුම්හි, එක් වසරක කාලයක් තුළ ගනුදෙණු (ආපසු ගැනීම්) සිදු නොවූ කල්හි එම ගිණුම් "ක්‍රියා විරහිත" (Inactive) ගිණුම්" ලෙස වර්ගීකරණය කරනු ලැබේ.
2 වන අදියරය - "අක්‍රිය" (Dormant) වශයෙන් ගිණුම් වර්ගීකරණය (ශ්‍රී ලංකා මහ බැංකුවේ සම්මත ක්‍රියා පටිපාටිය අනුව, අක්‍රීය ගිණුම් ක්‍රියාත්මක වේ. වසර 10කට වැඩි කාලයකට ගනුදෙනු හෝ ලිපිහුවමාරුවක් නොමැති ගිණුම් "අක්‍රීය ගිණුම්" ලෙස වර්ගීකරණය කර, ඉන් අනතුරුව 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරනු ලැබේ.)

**8) <u>අනුමැතිය නොලද ගනුදෙනු සහ වරදවා සටහන් කල ගනුදෙනු</u>**

මෙම ගනුදෙනු සම්බන්ධව පැමිණිලි කිරීම සඳහා පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය වෙත අවධානය යොමු කරන්න.

A golden opportunity for an intelligent Savings



## PMF ඉතිරි කිරීම් තැන්පතු

නැණවත් ඉතිරි කිරීමක් සඳහා ස්වර්ණමය අවස්ථාව.

# මූලික තොරතුරු ලේඛනය

## ඉතිරි කිරීමේ තැන්පත්

## සාමාන්‍ය ඉතිරිකිරීමේ තැන්පත් ගිණුම (NORMAL SAVINGS DEPOSIT)

### 1. නිමැවුමෙහි ස්වභාවය

ඔබගේ **ඉතිරි කිරීම් සඳහා,** PMF **ඉතිරි කිරීම්** තැන්පතු ඉහළම පොලී අනුපාතයක් **ලබා දෙනු ඇත.**

**ප්‍රභේද:** සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම්, බාල වයස්කාර ඉතිරිකිරීමේ ගිණුම් සහ ජොෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම්

### 2. මූල්‍ය ශක්තිය සහ අනෙකුත් ප්‍රතිලාභ

- තරඟකාරි පොලී අනුපාත.
- දෛනිකව පොලී ගණනය කිරීම.
- උපරිම සුරක්ෂිත බව.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව.

### 3. අවම ශේෂ අවශ්‍යතා, ගිණුම ආරම්භ කිරීමේ ගාස්තු, ගිණුම පවත්වා ගෙන යාමේ ගාස්තු, ගිණුම වැසීමේ ගාස්තු

ගිණුමක් ආරම්භ කිරීමට මූලික තැන්පතුව රු.1,000/- කි. අවම ශේෂ අවශ්‍යතාවය වශයෙන් රු.1,000 පවත්වා ගෙන යායුතුය. මෙම මූලික තැන්පත් මුදල විටින් විට, සමාගමේ අභිමතය පරිදි වෙනස් වීමකට ලක් කල හැකිබව කාරුණිකව සළකන්න.

### 4. තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

"ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ක්‍රියාත්මක කරන, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, සුදුසුකම් ලබන එක් තැන්පත්කරුවකුට රු.1,100,000/- ක උපරිමයක් දක්වා පදනම මත වන්දි ලබාගැනීමට හැකිවන පරිදි සුදුසුකම් ලබන තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත."

### 5. අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද **ඉතිරි කිරීම්** සඳහා වූ අයදුම්පත.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කාඩ්පත්.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේ පත. - KYC (Know Your Customer) form.
- ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද සත්‍ය පිටපතක්.

- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

**6. <u>නියමයන් සහ කොන්දේසි</u>**

- **ඉතිරි කිරීම්** ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවම ශේෂ අවශ්‍යතාවයක් පවතින අතර, පොලී අනුපාතය, පොලී ගණනය කිරීමේ ක්‍රමය සහ පොලීය බැර කිරීම සිදුකරන්නේ මුල් මුදල පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි අභ්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුකූලවය.

- පොලී අනුපාතය හෝ බලපාන නීතිරීතියන්හි වෙනස් කිරීමේ හෝ සංශෝධන කිරීමේ පූර්ණ අයිතිය, සමාගම සතුවන අතර ඒ සම්බන්ධව පොදු දැන්වීම් හරහා මහජනතාව දැනුවත් කරනු ලැබේ.

- මුදල් තැන්පත් ඕනෑම ශාඛා කාර්යාලයකදි භාර ගෙන, ගිණුම පවත්වා ගෙන යන ශාඛා කාර්යාලයට, කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව මාරුකර යැවීම කර දෙනු ලැබේ.

- ගිණුමට චෙක්පත් තැන්පත් කිරීම සඳහා භාරගනු ලබන්නේ එම චෙක්පත් (“Pay PMF Finance PLC savings A/C no.......................... of Mr. /Mrs. ............................” ) “.............................මහතාගේ/මහත්මියගේ පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි ඉතිරිකිරීමේ ගිණුම් අංක .................යට ගෙවන්න,” වශයෙන් ලියා ඇත්නම් පමණි. ඉතිරිකිරීමේ ගිණුමක් හරහා චෙක්පත් තැන්පත් කිරීම හෝ චෙක්පත් නිශ්කාෂණ කටයුතු කල නොහැක.

- දෙදෙනෙකු හෝ වැඩි පිරිසකගේ නමට බද්ධ ගිණුමක් ආරම්භ කළ හැකි අතර එක්කෙනෙකුට හෝ ඒ සැමටම ගිණුමේ මෙහෙයවීම් කටයුතු සිදු කිරීමට පුළුවන.

- මුදල් ආපසු ගැනීම සඳහා තැන්පත්කරු/තැන්පත්කරුවන් පැමිණිය යුතු අතර පාස් පොත සමග ජාතික හැඳුනුම්පත/පත් ඉදිරිපත් කල යුතුය. තුන්වන පාර්ශවයකට මුදල් ආපසු ගැනීමට අනුමැතිය නොලැබේ.

- පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී පරිශ්‍රයෙන් නික්මීමට පෙර, ගනුදෙනුකරුවන් විසින් තමන්ගේ පාස් පොතේ තබා ඇති සටහන් නිවැරදි දැයි පිරික්ෂා කර බැලිය යුතුය. ගිණුම් පද්ධතියට පරිබාහිර සටහන් පිළිබඳ සමාගම වගකීම භාරගනු නොලැබේ.

- වංචා සහගතව හෝ වංකව කිසියම් පුද්ගලයෙක් විසින් කලා වුද, පාස්පොත, ජාතික හැඳුනුම්පත සහ තැන්පත්කරු විසින් අත්සන් කර ඇති බව කියන මුදල් ආපසු ගැනීමේපත ඉදිරිපත් කරන පාර්ශ්වයට පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී විසින් කරන ගෙවීම් සම්බන්ධයෙන් තැන්පත්කරුට ඇති සියලු වගකීම්වලින් පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී නිදහස් වනු ඇත.

- අස්ථානගත වූ හෝ විනාශ වූ පාස්පොතක් සම්බන්ධව සෑහීමකට පත්විය හැකි කරුණු දැක්වීමක් සමග උචිත හානිපූරණ සහතිකයක් සහ දිවුරුම් ප්‍රකාශයක්, පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී

වෙත ලබා දීමෙන් පවත්නා ශේෂය සඳහන් කර නව පාස් පොතක් නිකුත් කරන ලදුව, තැන්පත්කරු එය නිවැරදි සේ භාරගනු ඇත. එවන් අවස්ථාවන්හිදී ගාස්තුවක් අය කරනු ඇත.

- පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී භාරකාර අරමුදල් පිලිනොගනී.

- තැන්පතු සේවාවන් සඳහා අදාල වන පොලී අනුපාත අපගේ සියළුම ශාඛාවන්හි සහ අපගේ වෙබ් අඩවියේ සටහන් කර ඇත.

**7. <u>ක්‍රියා විරහිත (Inactive) සහ අක්‍රිය (Dormant) ගිණුම් හා සබැඳි, සමාගමේ ප්‍රතිපත්ති</u>**

- ඉතිරිකිරීමේ ගිණුමේ හිමිකරු සමාගම සමග එක් වසරක් ගනුදෙනු කර නොමැතිව සිටි අවස්ථාවක, ගිණුම ක්‍රියා විරහිත (Inactive) ගිණුමක් සේ වර්ගීකරණය කෙරෙනු ඇත.

- ඉතිරිකිරීමේ ගිණුමේ හිමිකරු සමාගම සමග එම ගිණුම සම්බන්ධව වසර දහයක් ගනුදෙනු කර නොමැතිව සිටි අවස්ථාවක, ගිණුම අක්‍රිය (Dormant) ගිණුමක්සේ වර්ගීකරණය කෙරෙනු ඇත. ගිණුම යලි සක්‍රීය කෙරෙනුයේ ගනුදෙනුකරුගේ ඉල්ලීම මතය.

## බාල වයස්කාර ඉතිරිකිරීමේ ගිණුම (MINOR SAVINGS DEPOSIT)

1. **නිමැවුමෙහි ස්වභාවය**

අවුරුදු 18ට වඩා අඩු වයසැති දරුවෙක් වෙනුවෙන් මවට, පියාට හෝ නීත්‍යානුකූල භාරකරුවෙකුට මෙම ගිණුම ආරම්භ කල හැක.

2. **මූල්‍ය ශක්තිය සහ අනෙකුත් ප්‍රතිලාභ**

- තරගකාරි පොලී අනුපාත.
- දෛනිකව පොලී ගණනය කිරීම.
- උපරිම සුරක්ෂිත බව.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව

3. **අවම ශේෂ අවශ්‍යතා, ගිණුම ආරම්භ කිරීමේ ගාස්තු, ගිණුම පවත්වා ගෙන යාමේ ගාස්තු, ගිණුම වැසීමේ ගාස්තු**

ගිණුමක් ආරම්භ කිරීමට මූලික තැන්පතුව රු.1,000/- කි. අවම ශේෂ අවශ්‍යතාවය වශයෙන් රු.1,000 පවත්වා ගෙන යායුතුය. මෙම මූලික තැන්පත් මුදල විටින් විට, සමාගමේ අභිමතය පරිදි වෙනස් වීමකට ලක් කල හැකිබව කාරුණිකව සළකන්න.

4. **තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමය**

"ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ක්‍රියාත්මක කරන, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, සුදුසුකම් ලබන එක් තැන්පත්කරුවකුට රු.1,100,000/- ක උපරිමයක් දක්වා පදනම මත වන්දි ලබාගැනීමට හැකිවන පරිදි සුදුසුකම් ලබන තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත."

5. **අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්**

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ මව/පියා/භාරකරු විසින් අත්සන් කරන ලද බාලවයස්කාර **ඉතිරි කිරීම්** සඳහා වූ අයදුම්පත.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ මව/පියා/භාරකරු විසින් අත්සන් කරන ලද ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේ පත. - KYC (Know Your Customer) form.
- නිසි පරිදි සහතික කරන ලද දරුවාගේ උප්පැන්න සහතිකය.
- මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද සත්‍ය පිටපතක්.

- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

6. <u>**නියමයන් සහ කොන්දේසි**</u>

- **ඉතිරි කිරීමේ** ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවම ශේෂ අවශ්‍යතාවයක් පවතින අතර, පොලී අනුපාතය, පොලී ගණනය කිරීමේ ක්‍රමය සහ පොලීය බැර කිරීම සිදුකරන්නේ පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි අභ්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුකූලවය.

- පොලී අනුපාතය සංශෝධන කිරීමේ පූර්ණ අයිතිය, සමාගම සතුවන අතර ඒ සම්බන්ධව පොදු දැන්වීම් මාධ්‍යයන් හරහා මහජනතාව දැනුවත් කරනු ලැබේ.

- මුදල් තැන්පත් ඕනෑම ශාඛා කාර්‍යාලයකදි භාර ගෙන, ගිණුම පවත්වා ගෙන යන ශාඛා කාර්‍යාලයට, කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව මාරුකර යැවීම කර දෙනු ලැබේ.

- වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විට, බාලවයස්කාර **ඉතිරි කිරීමේ** ගිණුම සාමාන්‍ය **ඉතිරි කිරීමේ** ගිණුමක් බවට පත් කරනු ලැබේ.

- මුදල් ආපසු ගැනීම සඳහා අවසර හිමි වන්නේ බාලවයස්කරුවන්ගේ අධ්‍යාපනික, වෛද්‍ය වැනි දැඩි අවශ්‍යතාවන් සඳහා වලංගු ලියකියවිලි සහිතව දෙමාපිය/භාරකරුගේ අත්සන මත කරන ඉල්ලීම් සමාගමේ අභිමතයට යටත්වය.

- පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී පරිශ්‍රයෙන් නික්මීමට පෙර, ගනුදෙනුකරුවන් විසින් තමන්ගේ පාස් පොතේ තබා ඇති සටහන් නිවැරදි දැයි පිරික්ෂා කර බැලිය යුතුය. ගිණුම් පද්ධතියට පරිබාහිර සටහන් පිළිබඳ සමාගම වගකීම භාරගනු නොලැබේ.

- අස්ථානගත වූ හෝ විනාශ වූ පාස්පොතක් සම්බන්ධව සෑහීමකට පත්විය හැකි කරුණු දැක්වීමක් සමග උචිත හානිපූරණ සහතිකයක් සහ දිවුරුම් ප්‍රකාශයක්, මව/පියා/භාරකරු විසින් පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී වෙත ලබා දීමෙන් පවත්නා ශේෂය සඳහන් කර නව පාස් පොතක් නිකුත් කරන ලදුව, තැන්පත්කරු එය නිවැරදි සේ භාරගනු ඇත.

## ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ තැන්පත් ගිණුම (SENIOR CITIZEN SAVINGS DEPOSITS)

1. **නිමැවුමෙහි ස්වභාවය**

වලංගු ජාතික හැඳුනුම්පතක් හෝ විදේශ ගමන් බලපත්‍රයක් සතු අවුරුදු 60 ඉක්මවූ ශ්‍රී ලාංකිකයන් හෝ වීසා හිමි නේවාසිකයන්හට මෙම ගිණුම ආරම්භ කල හැක.

2. **මූල්‍ය ශක්තිය සහ අනෙකුත් ප්‍රතිලාභ**

- තරඟකාරි පොලී අනුපාත.
- දෛනිකව පොලී ගණනය කිරීම.
- උපරිම සුරක්ෂිත බව.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව.

3. **අවම ශේෂ අවශ්‍යතා, ගිණුම ආරම්භ කිරීමේ ගාස්තු, ගිණුම පවත්වා ගෙන යාමේ ගාස්තු, ගිණුම වැසීමේ ගාස්තු**

ගිණුමක් ආරම්භ කිරීමට මූලික තැන්පතුව රු.1,000/- කි. අවම ශේෂ අවශ්‍යතාවය වශයෙන් රු.1,000 පවත්වා ගෙන යායුතුය. මෙම මූලික තැන්පත් මුදල විටින් විට, සමාගමේ අභිමතය පරිදි වෙනස් වීමකට ලක් කල හැකිබව කාරුණිකව සළකන්න.

4. **තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමය**

"ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය ක්‍රියාත්මක කරන, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, සුදුසුකම් ලබන එක් තැන්පත්කරුවකුට රු.1,100,000/- ක උපරිමයක් දක්වා පදනම මත වන්දි ලබාගැනීමට හැකිවන පරිදි සුදුසුකම් ලබන තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත."

5. **අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්**

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද **ඉතිරි කිරීම්** සඳහා වූ අයදුම්පත.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද කාඩ්පත්.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේ පත. - KYC (Know Your Customer) form.
- ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද සත්‍ය පිටපතක්.
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.
- නාමිකයන් තහවුරු කරන ලද ප්‍රකාශය.
- රඳවාගැනීමේ බද්ද සම්බන්ධ නිසි පරිදි අත්සන් සහිත කරන ලද ප්‍රකාශය. (අදාළ වන්නේ නම්)

## 6. <u>නියමයන් සහ කොන්දේසි</u>

- **ඉතිරි කිරීමේ** ගිණුමක් ආරම්භ කිරීම සඳහා අවම ශේෂ අවශ්‍යතාවයක් පවතින අතර, පොලී අනුපාතය, පොලී ගණනය කිරීමේ ක්‍රමය සහ පොලිය බැර කිරීම සිදුකරන්නේ පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි අභ්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුකූලවය.
- පොලී අනුපාතය හෝ නීති රීති සංශෝධන කිරීමේ පූර්ණ අයිතිය, සමාගම සතුවන අතර ඒ සම්බන්ධව පොදු දැන්වීම් මාධ්‍යයන් හරහා මහජනතාව දැනුවත් කරනු ලැබේ.
- මුදල් තැන්පත් ඕනැම ශාඛා කායර්‍යාලයකදී භාර ගෙන, ගිණුම පවත්වා ගෙන යන ශාඛා කායර්‍යාලයට, කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව මාරුකර යැවීම කර දෙනු ලැබේ.
- ගිණුමට චෙක්පත් තැන්පත් කිරීම සඳහා භාරගනු ලබන්නේ එම චෙක්පත් ("Pay PMF Finance PLC savings A/C no.......................... of Mr. /Mrs. ............................" ) "..............................මහතාගේ/මහත්මියගේ පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී හි ඉතිරිකිරීමේ ගිණුම් අංක ..................යට ගෙවන්න," වශයෙන් ලියා ඇත්නම් පමණි. ඉතිරිකිරීමේ ගිණුමක් හරහා චෙක්පත් තැන්පත් කිරීම හෝ චෙක්පත් නිශ්කාෂණ කටයුතු කල නොහැක.
- දෙදෙනෙකු හෝ වැඩි පිරිසකගේ නමට බද්ධ ගිණුමක් ආරම්භ කළ හැකි අතර එක්කෙනෙකුට හෝ ඒ සැමටම ගිණුමේ මෙහෙයවීම් කටයුතු සිදු කිරීමට පුළුවන.
- මුදල් ආපසු ගැනීම සඳහා තැන්පත්කරු/තැන්පත්කරුවන් පැමිණීය යුතු අතර පාස් පොත සමග ජාතික හැඳුනුම්පත/පත් ඉදිරිපත් කල යුතුය. තුන්වන පාර්ශවයකට මුදල් ආපසු ගැනීමට අනුමැතිය නොලැබේ.
- පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී පරිශ්‍රයෙන් නික්මීමට පෙර, ගනුදෙනුකරුවන් විසින් තමන්ගේ පාස් පොතේ තබා ඇති සටහන් නිවැරදි දැයි පිරික්ෂා කර බැලිය යුතුය. ගිණුම් පද්ධතියට පරිබාහිර සටහන් පිළිබඳ සමාගම වගකීම භාරගනු නොලැබේ.
- වංචා සහගතව හෝ වංකව කිසියම් පුද්ගලයෙක් විසින් කලා වූද, පාස්පොත, ජාතික හැඳුනුම්පත සහ තැන්පත්කරු විසින් අත්සන් කර ඇති බව කියන මුදල් ආපසු ගැනීමේ පත ඉදිරිපත් කරන පාර්ශ්වයට පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී විසින් කරන ගෙවීම් සම්බන්ධයෙන් තැන්පත්කරුට ඇති සියලු වගකීම්වලින් පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී නිදහස් කෙරෙනු ඇත.
- අස්ථානගත වූ හෝ විනාශ වූ පාස්පොතක් සම්බන්ධව සෑහිමකට පත්විය හැකි කරුණු දැක්වීමක් සමග උචිත හානිපූරණ සහතිකයක් සහ දිවුරුම් ප්‍රකාශයක්, පීඑම්ෆ් ෆිනෑන්ස් පීඑල්සී වෙත ලබා දීමෙන් පවත්නා ශේෂය සඳහන් කර නව පාස් පොතක් නිකුත් කරන ලදුව, තැන්පත්කරු එය නිවැරදි පාස් පොතක් සේ භාරගනු ඇත.
- තැන්පත්කරුගේ අභාවයේදී ගිණුමේ පවතින ශේෂය, පාස්පොත සහ අදාල ලියකියවිලි ඉදිරිපත් කල කල්හි නම් කල තැනැත්තාට ගෙවනු ලැබේ.

## 7. <u>ක්‍රියා විරහිත (Inactive) සහ අක්‍රිය (Dormant) ගිණුම් හා සබැඳි, සමාගමේ ප්‍රතිපත්ති</u>

- ඉතිරිකිරීමේ ගිණුමේ හිමිකරු සමාගම සමග එක් වසරක් ගනුදෙනු කර නොමැතිව සිටි අවස්ථාවක, ගිණුම ක්‍රියා විරහිත (Inactive) ගිණුමක්සේ වර්ගීකරණය කෙරෙනු ඇත.
- ඉතිරිකිරීමේ ගිණුමේ හිමිකරු සමාගම සමග එම ගිණුම සම්බන්ධව වසර දහයක් ගනුදෙනු කර නොමැතිව සිටි අවස්ථාවක, ගිණුම අක්‍රිය (Dormant) ගිණුමක්සේ වර්ගීකරණය කෙරෙනු ඇත. ගිණුම යලි සක්‍රිය කෙරෙනුයේ ගනුදෙනුකරුගේ ඉල්ලීම මතය.




## PMF කල්බදු ණය

ඔබගේ සිහිනය සැබෑ කරලන්නෙමු.

# මූලික තොරතුරු ලේඛනය

## වාහන කල්බදු ණය **VEHICLE LEASING**

## සිවු රෝද කල්බදු / වාහන ණය

### 1. නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය

- අති නවීන/නැවත සකස් කරන ලද (Re-conditioned)/ලියාපදිංචි කරන ලද වාහන සඳහා කල්බදු පහසුකම්.
- අවම ලියකියවිලි අවශ්‍යතා.
- සමාගම සමග ගිණුම් සම්බන්ධතා පෙර පවත්වා තිබීම අනවශ්‍යය.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව.
- තරඟකාරි පොලී අනුපාත.
- එක් දින ක්ෂණික සේවාව.
- ඔබගේ ආදායමට සරිලන දැරිය හැකි පහසු ආපසු ගෙවීමේ සැළසුම්.

### 2. පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය වාර්ෂිකව 15%-17% දක්වා
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ලැබිය යුතු සම්පූර්ණ මුදලින් 2% ක මුද්දර ගාස්තුවක් කල්බදු පහසුකම් සඳහා ගෙවිය යුතුවේ.

| කල්බදු මුදල (රු.) | ප්‍රලේඛන ගාස්තු (රු.) |
|---|---|
| **200,000/-** සිට **999,999/-** | 6,000 |
| **1,000,000/-** සිට **2,499,999/-** | 8,000 |
| **2,500,000/-** සිට **4,999,999/-** | 10,000 |
| **5,000,000/-** සහ ඊට වැඩි | 12,000 |

- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්‍යාංශය වෙත රු.1,500/- ගාස්තුවක් (CRIB Charges ) සෑම කල්බදු පහසුකමකටම ගෙවිය යුතුවේ.
- ප්‍රලේඛන ගාස්තු වශයෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් අය කරනු ලැබේ.
- රක්ෂණය, මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තුමේන්තු ගාස්තු වැනි අනෙකුත් ගාස්තු අදාලවේ.
- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කිරීමට සමාගමට අයිතිවාසිකමක් ඇත.

**3.** මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත

වාහන කල්බදු සේවාව/රථවාහන ණය PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

ගනුදෙනුකරුගේ ස්වභාවය අනුව මතු සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

**තනි පුද්ගලයන්**

- අයදුම්කරුගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය /වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- තක්සේරු වාර්ථාව (අති නවීන වාහන සඳහා අදාල නොවේ.)
- වාහනයේ ලියාපදිංචි සහතිකය (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ආදායම තහවුරු කරන ලේඛන/බැංකු වාර්තා/වැටුප් සනාථ කෙරෙන ලිපිය/වැටුප් පත්‍රිකා යනාදිය .......
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

කේවල ස්වාමි ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර

- කේවල ව්‍යාපාර හිමිකරුගේ / හවුල්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත / වලංගු රියදුරු බලපත්‍රය / වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය.
- ආදායම තහවුරු කරන ලේඛන-මූල්‍ය වාර්තා/බැංකු වාර්තා යනාදිය ...
- කේවල ව්‍යාපාර හිමිකරුගේ / හවුල්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ වත්කම් ප්‍රකාශය.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- තක්සේරු වාර්ථාව (අති නවීන වාහන සඳහා අදාල නොවේ.)
- වාහනයේ ලියාපදිංචි සහතිකය (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

**වගකීම සීමාසහිත පෞද්ගලික සමාගම්**

- අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත / වලංගු රියදුරු බලපත්‍රය / වලංගු විදේශ ගමන් බලපත්‍රය.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- සංස්ථාපිත සහතිකය ("2A" ආකෘතිපත්‍රය - සහතික කරන ලද පිටපත)
- සංගමික ව්‍යවස්ථාවලිය (සහතික කරන ලද පිටපත)
- වාහන කල්බදු සේවාව/රථවාහන ණය ලබාගැනීම සඳහා අනුමත වී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ.
- 1 ආකෘතිපත්‍රය හෝ 40 ආකෘතිපත්‍රය (අධ්‍යක්ෂවරුන්ගේ නම් – සහතික කරන ලද පිටපත )
- 20 ආකෘතිපත්‍රය (අධ්‍යක්ෂවරුන්ගේ/ලේකම්ගේ වෙනසක් සිදුවී තිබේ නම් – සහතික කරන ලද පිටපත)
- 15 ආකෘතිපත්‍රය (වාර්ෂික වාර්තා - සහතික කරන ලද නවතම පිටපත)
- 13 ආකෘතිපත්‍රය (ව්‍යාපාරික ලිපිනයේ වෙනසක් වී තිබේ නම්)
- ආදායම තහවුරු කරන ලේඛන - විගණනය කල ගිණුම්/නවතම කෙටුම්පත් ගිණුම්/බැංකු වාර්තා යනාදිය ...
- අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇපකරුවන්ගේ වත්කම් ප්‍රකාශ.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- තක්සේරු වාර්ථාව (අතිනවීන වාහන හැර අනෙකුත් වාහන සඳහා)
- වාහනයේ ලියාපදිංචි සහතිකය (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ අධ්‍යක්ෂවරුන් පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

4. **<u>මූලික නියමයන් සහ කොන්දේසි</u>**

- මෙම සේවාව තනි පුද්ගලයන්ට, සුළු හා මධ්‍යම ව්‍යවසායකයන්හට සහ සමාගම්වලට ලබා ගත හැක.
- තනි පුද්ගල අයදුම්කරුවන් නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මෙම සේවාව ලබාගන්නා අවස්ථාව වන විට අවම වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.
- දැනටමත් ලියාපදිංචි වාහන සඳහා වාහන කල්බදු සේවාව සහ රථවාහන ණය ලබා ගත හැක්කේ, වසර 2000න් පසු නිෂ්පාදිත රථවාහන සඳහා පමණි.
- රථවාහන ණය ලබා ගත හැක්කේ, කාර්, වෑන්, SUVs , ඩබල් කැබ් සහ කුඩා ට්‍රක් රථ (Mini Trucks) සඳහා පමණි.
- කාර්, වෑන්, SUVs, ඩබල් කැබ්, මෝටර් ලොරි/ට්‍රක්ස්/සිංගල් කැබ්ස් සහ කුඩා/මිනි ට්‍රක්ස් සඳහා වාහන කල්බදු සේවාව සලසා දිය හැක.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**

- වාහන කල්බදු සේවාව - 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත
- රථවාහන ණය - 1949 අංක 6 දරන උකස් පනත

6. **<u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>**

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

## ත්‍රිරෝද රථ කල්බදු සේවාව

1. **<u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>**

**සුදුසුකම් ලබන ගනුදෙනුකාර භවතුන්;**

- තනි පුද්ගලයන්
- රජයේ සහ පුද්ගලික අංශයේ සේවක භවතුන්
- ව්‍යාපාර ආයතන (කේවල ස්වාමි ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර සහ **වගකීම සීමාසහිත පෞද්ගලික සමාගම්)**

<u>වාහන වර්ගය</u>
**ත්‍රිරෝද රථ කල්බදු සේවාව අති නවීන සහ ලියාපදිංචි**
(නිෂ්පාදිත වසර 2000න් පසු ඉංග්‍රීසි අක්ෂරය "G" සහ ඉන් පසු ලියාපදිංචි) "බජාජ්" ත්‍රිරෝද රථ**,**
(නිෂ්පාදිත වසර 2025න් පසු ඉංග්‍රීසි අක්ෂර "ABU" සහ ඉන් පසු ලියාපදිංචි) "TVS" ත්‍රිරෝද රථ**,**
සහ
(නිෂ්පාදිත වසර 2010න් පසු ඉංග්‍රීසි අක්ෂරය "Y" සහ ඉන් පසු ලියාපදිංචි) "Piaggio" ත්‍රිරෝද රථ**,**
සඳහා ලබා ගත හැක.

**<u>කාලසීමාව</u>**
අවම **කාලසීමාව - මාස 12**
උපරිම **කාලසීමාව - මාස 60**

2. **<u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>**

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය වාර්ෂිකව 25%-28% දක්වා
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- සම්පූර්ණ සේවා ගාස්තු රු.5,000/- (එක් සේවා කටයුත්තකට ප්‍රලේඛන ගාස්තු රු.4,000/- + තක්සේරු ගාස්තු රු.850/-).
- රක්ෂණය, මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තුමේන්තු ගාස්තු වැනි අනෙකුත් ගාස්තු අදාලවේ.
- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කිරීමට සමාගමට අයිතිවාසිකමක් ඇත.

3. **<u>මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>**

ත්‍රිරෝද කල්බදු සේවාව PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

ත්‍රීරෝද කල්බදු සේවාව PMF වෙතින් ලබාගැනීම සඳහා ගනුදෙනුකරුගේ ස්වභාවය අනුව මතු සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- අයදුම්කරුගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය /වලංගු විදේශ ගමන් බලපත්‍රයන්හි පිටපතක්.
- වාහන සැපයුම්කරුගේ නාමමාත්‍ර/මුල් ඉන්වොයිසිය.
- ලියාපදිංචි ත්‍රීරෝද **සඳහා,** කල්බදු සේවාව ලබාගැනීමට අදහස් කරන්නේ නම් සමාගමේ අනුමත තක්සේරුවරයෙකුගේ තක්සේරු වාර්ථාවක් (දින 30 තුළ නිකුත් කල) ඉදිරිපත් කල යුතුවේ. අනුමත තක්සේරුවරයෙකු නොවූ කල්හි, සමාගම විසින් නම් කරන තක්සේරුවරයෙක් විසින් නිකුත් කරන මාර්ගස්ත තක්සේරු වාර්ථාවක් (online valuation report) සමාගම විසින් පිළිගැනීමට හැකියාව ඇත.
- වාහනයේ ලියාපදිංචි සහතිකයේ පිටපත.
- ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේපත. - KYC (Know Your Customer) form.
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්‍යාංශය (CRIB) විසින් නිකුත් කරන ලද වාර්තාව.
- වර්තමානයේ ආදායම/ආපසු ගෙවීමේ හැකියාව තහවුරු කරන වලංගු ලේඛන, තිබේ නම්.

4. **<u>මූලික නියමයන් සහ කොන්දේසි</u>**

- මෙම සේවාව තනි පුද්ගලයන්ට සහ සමාගම්වලට ලබා ගත හැක.
- තනි පුද්ගල අයදුම්කරුවන් නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මෙම සේවාව ලබාගන්නා අවස්ථාව වන විට අවම වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**

- 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත

6. **<u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>**

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

# ද්විත්ව රෝද කල්බදු සේවාව

## 1. නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය

**සුදුසුකම් ලබන ගනුදෙනුකාර භවතුන්:**

- තනි පුද්ගලයන් (ගොවීන්, ව්‍යවසායක පන්තියේ ස්වයං රැකියාවන්හි නියැලෙන්නන්)
- රජයේ සහ පුද්ගලික අංශයේ සේවක භවතුන් (වැටුප් ලබන)
- ව්‍යාපාර ආයතන (කේවල ස්වාමි ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර සහ **වගකීම සීමාසහිත පෞද්ගලික සමාගම්)**

**වාහන වර්ගය**

විදුලි බලයෙන් ධාවනය කල හැකි අති නවීන යතුරුපැදි සඳහා - අවම මාස 12 **කාලසීමාව** සිට උපරිම මාස 36 **කාලසීමාව** දක්වා

**ද්විත්ව රෝද කල්බදු සේවාව අති නවීන සහ** ලියාපදිංචි (වසර 2013 සහ පසු නිෂ්පාදිත) "බජාජ්", හොන්ඩා, යමහා, හීරෝ සහ TVS යතුරුපැදි සඳහා ලබා ගත හැක.

**කාලසීමාව**

අවම **කාලසීමාව - මාස 12**
උපරිම **කාලසීමාව - මාස 48**

| වර්ගය | කාලසීමාව |
|---|---|
| **අති නවීන** | මාස 48 |
| **ලියාපදිංචි කල** | 2013 සිට 2016 දක්වා – මාස 36 |
| | 2017 සහ ඉන් පසු – මාස 48 |

## 2. පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාත වාර්ෂිකව 24% -35% දක්වා.
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ලියාපදිංචි යතුරුපැදියකට සම්පූර්ණ සේවා ගාස්තු රු.6,300/- (ප්‍රලේඛන ගාස්තු රු.3,000/- + තක්සේරු ගාස්තු රු.850/- + (CRIB) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය ගාස්තු රු.1,500/- + පරිපාලන ගාස්තු රු.950/-).
- අති නවීන යතුරුපැදියකට සම්පූර්ණ සේවා ගාස්තු රු.5,500/- (ප්‍රලේඛන ගාස්තු රු.3,000/- + CRIB ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය ගාස්තු රු.1,500/- + පරිපාලන ගාස්තු රු.1,000/-).
- රක්ෂණය, මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තුමේන්තු ගාස්තු වැනි අනෙකුත් ගාස්තු අදාලවේ.

- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කිරීමට සමාගමට අයිතිවාසිකමක් ඇත.

**3.** මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත

**ද්විත්ව** කල්බදු සේවාව PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

ද්විත්ව **රෝද** කල්බදු සේවාව PMF වෙතින් ලබාගැනීම සඳහා ගනුදෙනුකරුගේ ස්වභාවය අනුව මතු සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- අයදුම්කරුගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය /වලංගු විදේශ ගමන් බලපත්‍රයන්හි පිටපතක්.
- වාහන සැපයුම්කරුගේ නාමමාත්‍ර/මුල් ඉන්වොයිසිය.
- ලියාපදිංචි ද්විත්ව **රෝද සඳහා,** කල්බදු සේවාව ලබාගැනීමට අදහස් කරන්නේ නම් සමාගමේ අනුමත තක්සේරුවරයෙකුගේ තක්සේරු වාර්ථාවක් (දින 30 තුළ නිකුත් කල) ඉදිරිපත් කල යුතුවේ. අනුමත තක්සේරුවරයෙකු නොවූ කල්හි, සමාගම විසින් නම් කරන තක්සේරුවරයෙක් විසින් නිකුත් කරන මාර්ගස්ත තක්සේරු වාර්ථාවක් (online valuation report) සමාගම විසින් පිළිගැනීමට හැකියාව ඇත.
- වාහනයේ ලියාපදිංචි සහතිකයේ පිටපත.
- ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේපත. - KYC (Know Your Customer) form.
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්‍යාංශය (CRIB) විසින් නිකුත් කරන ලද වාර්තාව.
- වර්තමානයේ ආදායම/ආපසු ගෙවීමේ හැකියාව තහවුරු කරන වලංගු ලේඛන, තිබේ නම්.

**4.** <u>මූලික නියමයන් සහ කොන්දේසි</u>

- මෙම සේවාව තනි පුද්ගලයන්ට සහ සමාගම්වලට ලබා ගත හැක.
- තනි පුද්ගල අයදුම්කරුවන් නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මෙම සේවාව ලබාගන්නා අවස්ථාව වන විට අවම වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**
- 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත

**6.** <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

# මූලික තොරතුරු ලේඛනය

## ඉක්මන් ඩ්‍රාෆ්ට්

1. **<u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>**

- අනුමත වී ඇති කාල පරාසයට යටත්ව, මූලික ණය මුදල ඕනෑම අවස්ථා සංඛ්‍යාවක් තුල ලබාගැනීමටත්/පියවීමටත් හැකි වීම.
- දැනට හිඟ හිට ඇති මුල් මුදලට අදාළ මාසික පොලිය, අවම ගෙවීම වශයෙන් ගෙවීමට ඇති පහසුකම.
- දෛනික පදනම මත, පොලිය ගණනය කිරීම.
- ණය පහසුකම් කාලය අවසානයේදී, හිඟ හිට ඇති මුල් මුදල ආපසු ගෙවීමේ පහසුකම.
- ණය ගැනුම්කරුගේ අවශ්‍යතා මත මුල් මුදල කොටස් වශයෙන් ආපසු ගෙවීමේ පහසුකම.

2. **<u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>**

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය වාර්ෂිකව 14%-17% දක්වා
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ණය මුදලින් 0.1% ක මුද්දර ගාස්තුවක් "ඉක්මන් ඩ්‍රාෆ්ට්" සඳහා ගෙවිය යුතුවේ.
- ප්‍රලේඛන ගාස්තු වශයෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් අය කරනු ලැබේ.

| "ඉක්මන් ඩ්‍රාෆ්ට්" මුදල(රු.) | ප්‍රලේඛන ගාස්තු (රු.) |
|---|---|
| **100,000 සිට 999,999** | 6,000 |
| **1,000,000 සිට 2,499,999** | 8,000 |
| **2,500,000 සිට 4,999,999** | 10,000 |
| **5,000,000 සහ ඉන් ඉහළට** | 12,000 |

- රක්ෂණය, මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තුමේන්තු ගාස්තු වැනි අනෙකුත් ගාස්තු අදාලවේ.
- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කරනු ඇත.

3. **<u>මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>**

ඉක්මන් ඩ්‍රාෆ්ට් සේවාව PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

ගනුදෙනුකරුගේ ස්වභාවය අනුව මතු සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

**<u>තනි පුද්ගලයන්</u>**

- අයදුම්කරුගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය /වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- තක්සේරු වාර්ථාව (අතිනවීන වාහන සඳහා අදාල නොවේ.)
- වාහනයේ ලියාපදිංචි සහතිකය (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ආදායම තහවුරු කරන ලේඛන/බැංකු වාර්තා/වැටුප් සනාථ කෙරෙන ලිපිය/වැටුප් පත්‍රිකා යනාදිය .......
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

<u>කේවල ස්වාමි ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර</u>

- කේවල ව්‍යාපාර හිමිකරුගේ / හවුල්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත / වලංගු රියදුරු බලපත්‍රය / වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය.
- ආදායම තහවුරු කරන ලේඛන-මූල්‍ය වාර්තා/බැංකු වාර්තා යනාදිය ...
- කේවල ව්‍යාපාර හිමිකරුගේ / හවුල්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ වත්කම් ප්‍රකාශ.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- සැපයුම්කරුගේ හැඳුනුම්පතේ පිටපත ( තනි සැපයුම්කරුවන් සඳහා)
- තක්සේරු වාර්ථාව (අතිනවීන වාහන සඳහා අදාල නොවේ.)
- වාහනයේ ලියාපදිංචි සහතිකය (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

**<u>වගකීම සීමාසහිත පෞද්ගලික සමාගම්</u>**

- අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇපකරුවන්ගේ ජාතික හැඳුනුම්පත / වලංගු රියදුරු බලපත්‍රය / වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුවන්ගේ ප්‍රකාශ.
- සංස්ථාපිත සහතිකය ("2A" ආකෘතිපත්‍රය - සහතික කරන ලද පිටපත)
- සංගමික ව්‍යවස්ථාවලිය (සහතික කරන ලද පිටපත)
- වාහන කල්බදු සේවාව/රථවාහන ණය ලබාගැනීම සඳහා අනුමත වී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ.
- 1 ආකෘතිපත්‍රය හෝ 40 ආකෘතිපත්‍රය (අධ්‍යක්ෂවරුන්ගේ නම් – සහතික කරන ලද පිටපත )

- 20 ආකෘතිපත්‍රය (අධ්‍යක්ෂවරුන්ගේ/ලේකම්ගේ වෙනසක් සිදුවී තිබේ නම් – සහතික කරන ලද පිටපත)
- 15 ආකෘතිපත්‍රය (වාර්ෂික වාර්තා - සහතික කරන ලද නවතම පිටපත)
- 13 ආකෘතිපත්‍රය (ව්‍යාපාරික ලිපිනයේ වෙනසක් වී තිබේ නම්)
- ආදායම තහවුරු කරන ලේඛන - විගණනය කල ගිණුම්/නවතම කෙටුම්පත් ගිණුම්/බැංකු වාර්තා යනාදිය ...
- අධ්‍යක්ෂවරුන්ගේ සහ ඇපකරුවන්ගේ වත්කම් ප්‍රකාශ.
- නාමමාත්‍ර ඉන්වොයිසිය.
- තක්සේරු වාර්ථාව (අතිනවීන වාහන හැර අනෙකුත් වාහන සඳහා)
- වාහනයේ ලියාපදිංචි සහතිකයේ පිටපත (ලියාපදිංචි කරන ලද වාහන සඳහා)
- ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනයේ අධ්‍යක්ෂවරුන් පදිංචි වී නොසිටින්නේ නම් උපයෝගිතා බිල්පත්/ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුම් වාර්තා/කුලී නිවාස ගිවිසුම/රාජ්‍ය ආයතනයකින් පදිංචිය සනාථ කර නිකුත් කරන ලද ලිපියක්.

## 4. <u>මූලික නියමයන් සහ කොන්දේසි</u>

- මෙම සේවාව තනි පුද්ගලයන්ට, සුළු හා මධ්‍යම ව්‍යවසායකයන්හට සහ සමාගම්වලට ලබා ගත හැක.
- තනි පුද්ගල අයදුම්කරුවන් නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මෙම සේවාව ලබාගන්නා අවස්ථාව වන විට අවම වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.
- ඉක්මන් ඩ්‍රාෆ්ට් සේවාව අවම මාස 6 සිට මාස 12 දක්වා ලබා ගත හැක.
- ඉක්මන් ඩ්‍රාෆ්ට් සේවාව සඳහා ඇපයට මෝටර්රථයක් උකස් කළ යුතුය.

## 5. <u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>

- 1949 අංක 6 දරන උකස් පනත

## 6. <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.




## PMF වෙළෙඳ කටයුතු මූල්‍යකරණය

ඔබගේ ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන් සංකලනය කරන ලද මූල්‍ය විසඳුම්.

# මූලික තොරතුරු ලේඛනය

## වෙළෙඳ කටයුතු මූල්‍යකරණය DEALER FINANCE

1. **<u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>**

- රථවාහන ආනයන ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නියැලි සිටින ගනුදෙනුකරුවන්ගේ කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන් මූල්‍යකරණය කිරීමට මෙම සේවාව ලබා දෙනු ලැබේ.
- ආනයනකරුවන්ට ණයවර ලිපි පහසුකම් සහ පශ්චාත් ආනයන ණය ඇතුළු ණය පහසුකම්.
- රේගු තීරුබදු පියවීම සඳහා ආනයන ණය.
- අරමුදල් ප්‍රවාහයට ගැලපෙන නම්‍යශීලි ණය ආපසු ගෙවීමේ පහසුකම්.(මාස 6කට වඩා අඩු)
- වරායේ සිට කාර් රථ ප්‍රදර්ශණාගාරය තෙක් සම්පූර්ණ වටිනාකම් දාමය නිරීක්ෂණය කිරීම සහ මෙහෙයවීම.

2. **<u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>**

- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ප්‍රලේඛන ගාස්තු වශයෙන් ණය මුදලේ ප්‍රමාණයෙන් එම සේවාවෙන් 0.1% ක් හෝ පහසුව සැළසීම මත රු.10,000/- අවම ගාස්තුවක් අය කරනු ලැබේ.
- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලීයක් අය කරනු ඇත.

3. **<u>මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>**

- අරමුදල් අවශ්‍යතා සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, මූල්‍ය තොරතුරු සහ උපකාරක ලියකියවිලි ඇතුළුව ඉල්ලා සිටින ලියකියවිලි සමඟ භාරදිය යුතුය.
- අදාළ බලධාරින්ගේ අනුමැතියෙන් අනතුරුව, ණය මුදල පිරිනැමීමේ ලිපිය, ණය අයදුම් කරන ලද පාර්ශවය විසින් පිළිගැනීම සඳහා නිකුත් කරනු ලැබේ.
- **ඇප/නීතිමය අවශ්‍යතා සම්බන්ධව ලිපිලේඛන කටයුතු සහ පිරිනැමීමේ ලිපියේ සඳහන්ව තිබූ වගන්ති සහ කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසු ණය මුදල මුදා හරිනු ලැබේ.**

4. **<u>මූලික නියමයන් සහ කොන්දේසි</u>**

- සියළුම ලිපිලේඛනයන් සම්පූර්ණ කිරිමට යටත්ව ණය මුදල නිකුත් කිරීමේ පරම අභිමතය ඇත්තේ පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී සතුවය.
- ලබා දී ඇති කෙටිකාලීන ණය පහසුකම්, පසු විපරමකින් අනතුරුව සිය තනි අභිමතය අනුව අවලංගු කිරීමේ අයිතිවාසිකම සමාගම සතුය.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**

- 1949 අංක 6 දරන උකස් පනත

## 6. <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

pmf finance Gold Loans

Golden solution for your urgent money requirements



# මූලික තොරතුරු ලේඛනය

## GOLD LOANS රන් ණය

## 1. නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය

- ඇපයක් ලෙස රන් ස්වර්ණාභරණ භාරගැනීමෙන් ණය දීම/අත්තිකාරම් දීම
- රන් ණය සඳහා රන් ඇසුරින් නිම කල භාණ්ඩ උකසට තබාගැනීම සඳහා භාර ගනු ලැබේ.
- රන් ණය සඳහා දෙදෙනෙකුට බද්ධව අයදුම් කළ නොහැකි අතර රන් ණය මතු සඳහන් තැනැත්තන් හට ලබා නොදේ.
  - ✓ බීමත්ව සිටින්නන්හට
  - ✓ සිහිවිකල් පුද්ගලයන්හට
  - ✓ වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්හට

## 2. පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය මාසිකව 1.25% - 2.33% දක්වා දෛනික පදනම මත.
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- තෝරා ගත් ගනුදෙනු සඳහා පමණක් 0.5% ප්‍රමාද දඩ ගාස්තු අය කරනු ලැබේ.
- ප්‍රලේඛන ගාස්තු නොමැත.

## 3. මෙම නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත

- ගනුදෙනුකරුවන්ගේ රන් භාණ්ඩයන්හි වටිනාකම තක්සේරු කරනු ලැබේ.
- රන් භාණ්ඩයන්හි අන්තර්ගත කැරට් අගය (රන් මිශ්‍රණ අගය) සහ බර මත ගනුදෙනුකරු ණය මුදලේ ප්‍රමාණය සම්බන්ධව එකඟත්වයකට පැමිණේ.
- ගනුදෙනුකරු රන් භාණ්ඩයන් ඇපයක් වශයෙන් සමාගමට භාරදෙනු ඇත.
- රන් ණය ගිවිසුම අත්සන් කිරිමෙන් ණය මුදල ලබා දෙනු ලැබේ.

## 4. මූලික නියමයන් සහ කොන්දේසි

- උකස් පනතේ 85/86/87 වගන්ති සඳහා ගනුදෙනුකරු එකඟත්වය පළකල යුතුය.

## 5. මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන

- 1949 අංක 6 දරන උකස් පනත

## 6. පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

# මූලික තොරතුරු ලේඛනය

## මූල්‍ය පිටුබලය සහිත ණය **CASH BACK LOANS**

## 1. <u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>

- අඩු පොලී අනුපාත.
- නම්‍යශීලී මාසික වාරික ගෙවීමට ඇති හැකියාව.
- අවම ලියකියවිලි.
- මනා පුහුණු කාර්ය මණ්ඩලයකින් පුද්ගල කේන්ද්‍රීය සේවාව.

## 2. <u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>

- වර්තමාන ස්ථාවර තැන්පත් අනුපාතය + 5%
- සමාගමේ අභිමතය මත සෑම ගාස්තුවක්ම විටින් විට වෙනස්වීමකට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

## 3. <u>නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>

- ඇපය වශයෙන් ස්ථාවර තැන්පත් සහතිකයේ මුල් පිටපත. (Original)
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද ගනුදෙනුකරුගේ ණය අයදුම් ලිපිය.
- නිසි පරිදි අත්සන් යෙදූ ගිවිසුම.
- නිසි පරිදි අත්සන් යෙදූ පියවා ගැනීමේ ලිපිය.
- අර්පණ ලිපිය සහ ප්‍රතිග්‍රහණ ලිපිය.
- වලංගු ජාතික හැඳුනුම්පත, රියැදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය.

## 4. <u>මූලික නියමයන් සහ කොන්දේසි</u>

- කල්පිරෙන අවස්ථාවේ පොලීය ගෙවන ස්ථාවර තැන්පත් සඳහා ස්ථාවර තැන්පත් මුදලේ වටිනාකමින් 90% ණය මුදලක්ද, මාස් පතා පොලීය ගෙවන ස්ථාවර තැන්පත් සඳහා ස්ථාවර තැන්පත් මුදලේ වටිනාකමින් 80% ණය මුදලක්ද ලබා ගත හැක.

- කල් පිරෙන අවස්ථාවේ පොලීය ගෙවන ස්ථාවර තැන්පත් සඳහා, ස්ථාවර තැන්පත් ගිණුම කල් පිරෙන අවස්ථාවේ, මුදල්-පිටුබලය සහිත ණය මුදල අඩු කර ඉතිරිය ගනුදෙනුකරුට ගෙවනු ලැබේ. මාසිකව පොලීය ගෙවන ස්ථාවර තැන්පත් සඳහා, ණය පොලීය මාසිකව, ස්ථාවර තැන්පත් පොලී මුදලින් අඩුකොට ඉතිරිය ගනුදෙනුකරුට පියවනු ලැබේ. කැමති නම්, ගනුදෙනුකරුට මාසික වාරික වශයෙන්ද, ණය ආපසු ගෙවිය හැකිය.

## 5. <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**



# මූලික තොරතුරු ලේඛනය

## නවෝදය ව්‍යවසායක ණය

## NAVODHAYA ENTREPRENEUR LOAN

1. <u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>

ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි (MSME) නියැලී සිටින ව්‍යවසායකයින් හට ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු ව්‍යාප්තිය සඳහා මූල්‍ය ආධාර කඩිනම්ව සැපයීමේ අරමුණින් යුතුව නවෝදය ව්‍යවසායක ණය සැලසුම හඳුන්වා දෙන ලදි. මෙම සැලසුම යටතේ අවම ණය මුදල රු.250,000/- වන අතර උපරිමය රු. මිලියන 3 වේ.

**සුදුසුකම් ලැබීමට තිබිය යුතු නිර්ණායකයන්**

- වයස අවු.20 – 60 දක්වා ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙක්, ව්‍යවසායක ණය සැලසුමට සුදුසුකම් ලබයි.
- අයදුම්කරු සුදුසුකම් ලබන ව්‍යාපාර ක්ෂේත්‍රයක වසර 1ක සාර්ථකව නියැලි සිට තිබිය යුතු වීම.
- ශ්‍රී ලංකා ණය තොරතුරු කායසීංශය අනුව අයදුම්කරු නිතිපතා ණය පියවන වාර්තා සටහනක් තබා තිබිය යුතුය.

2. <u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය වාර්ෂිකව 24% -26% දක්වා
- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ප්‍රලේඛන ගාස්තු වශයෙන් ණය මුදලේ ප්‍රමාණයෙන් 1% අය කරනු ලැබේ.
- ශ්‍රී ලංකා ණය තොරතුරු කායසීංශය ගාස්තුව රු.1,500/- (CRIB Charges )
- රක්ෂණ සහ මුද්දර බදු වශයෙන් - උකස් බැඳුම්කර වටිනාකමින් 0.1% (තිබේ නම්)
- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කරනු ඇත.

3. <u>නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>

ව්‍යවසායක ණය පහසුකම් PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

මෙම යෝජනාක්‍රමය යටතේ ණය මුදලක් අයදුම් කරන අයදුම්කරු මතු සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතුය.

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, ඇපකරුගේ ප්‍රකාශ.
- අයදුම්කරුගේ සහ ඇපකරුගේ ජාතික හැඳුනුම්පත, වලංගු රියැදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.

- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත/මහනගර සභාව හෝ ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරන ලද වරිපනම් බදු ලදුපත්/බෙදාහැරීමේ ගිවිසුම්/ ව්‍යාපාර ස්ථාපිත බව තහවුරු කරන ඉකුත් වසර 3 සඳහා බලපත්‍ර.
- අයදුම්කරුගේ සහ ඇපකරුවන්ගේ පදිංචි ස්ථානය තහවුරු කරන ලිපිනය සඳහන්, තැපැලෙන් ලැබුණු ලිපි (Billing proofs), (ඔබගේ පාරිභෝගිකයා හඳුනාගැනීමේ ලිපිලේඛන) (KYC documents)
- ඉකුත් මාස 6 ක ඉතිරි කිරීම්/ජංගම ගිණුම් ප්‍රකාශ සහ වෙනත් ආදායම් ලේඛන.
- ඇපකරුවන්ගේ ව්‍යාපාර පිළිබඳ ලිඛිත සාක්ෂි සහ ආදායම් වාර්ථා.

**4.** <u>මූලික නියමයන් සහ කොන්දේසි</u>

- ණය මුදල - රු.250,000/- සිට රු.මිලියන 3 දක්වා
- කාල සීමාව වසර 5 ක් දක්වා
- ආපසු ගෙවීම - මාසිකව හෝ සතිපතා.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**

- 1949 අංක 6 දරන උකස් පනත

**6. පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය**

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

pmf finance Margin Trading

Boost your Portfolio to the next level




# මූලික තොරතුරු ලේඛනය
# MARGIN TRADING

1. **<u>නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය</u>**

**කොටස් ප්‍රාග්ධන සහ ණය ප්‍රාග්ධන වෙළෙඳපලේ ආයෝජකයන්ගේ ආයෝජන කළඹ වැඩි දියුණු කිරීම සඳහා සුරැකුම්පත් හි අමතරව ආයෝජනය කිරීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම මෙම නිමැවුම තුලින් සැලසේ.**

2. **<u>පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්</u>**

- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.
- ආයෝජන කළඹ මාරු කිරීමේ පෞද්ගලික ගාස්තුව - රු.1,000/- ක ස්ථාවර ගාස්තුවක් හෝ ආයෝජන කළඹේ අගයෙන් 0.01% යන දෙකෙන් වැඩි ගාස්තුව, රු.10,000/- උපරිමයකට යටත්ව (2.5% සමාජ ආරක්ෂණ බද්ද (SSCL) සහ 18% එකතුකල අගය මත බද්ද (VAT) ඇතුළුව) .)

3. **<u>නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත</u>**

PMF වෙතින්, ආන්තික වෙළෙඳ ණය පහසුකම් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර භවතෙකුම ((https://pmf.lk) වෙබ් අඩවියට පිවිසීම හෝ ආන්තික වෙළෙඳ ණය පහසුකම් දෙපාර්තුමේන්තුව (Margin Trading Department) ඇමතීමට කටයුතු කළ යුතුය.

ආන්තික වෙළෙඳ ණය පහසුකම් ගිණුමක් ආරම්භ කල හැකි ක්‍රමවේද දෙකක් තිබේ.

1.Cash Margin – මුදල් ආන්තික විකල්පය

මුදල් ආන්තික විකල්පය යටතේ ආයෝජකයා විසින් ආයෝජන කටයුතු සඳහා තැන්පතු අත්තිකාරම් මුදලක් ලබා දෙන අතර, එය ඇප සුරකුම් මුදලක් ලෙස රඳවාගෙන, එම තැන්පතු අත්තිකාරම් මුදලෙහි ප්‍රමාණය අනුව, වෙළඳාම් කල හැකි සීමාව නියම කරනු ලැබේ.

2. Portfolio Margin - ආයෝජන කළඹ ආන්තික විකල්පය

ආයෝජන කළඹ ආන්තික විකල්පය යටතේ, මුදල් තැන්පතු වෙනුවට ආයෝජකයාගේ දැනට පවතින කොටස් ආයෝජන කළඹ ඇප සුරැකුමක් ලෙස තබා ගනිමින්, ආන්තික වෙළෙඳ ණය පහසුකම් ලබා දෙනු ලැබේ. හිමිකම් ලබන සමස්ථ ආන්තික වෙළෙඳ ණය පහසුකම තීරණය කරනුයේ, දිනයේ සෑම සුරැකුම්පත් කොටසකම අවසන් ගනුදෙනුවේ මිළ ප්‍රමාණයන් මතය.

**<u>අවශ්‍ය ලේඛන</u>**

**<u>තනි පුද්ගලයන්/බද්ධ</u>**

- (මධ්‍යම තැන්පතුගාර පද්ධති) CDS ගිණුම් අංකය සටහන් කරන ලද අයදුම්පත.
- ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සම්බන්ධ ලිපිලේඛන (KYC document).
- ගිවිසුම්
- අර්පණ ලිපිය
- ඉකුත් මාස 3ක බැංකු වාර්තා
- වැටුප් වාර්තා

- ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය.

<u>ආයෝජන කළඹ ආන්තික වෙළෙඳ ණය පහසුකම් සඳහා</u>

- තැරැව්කරු විසින් ආයෝජන කළඹ තක්සේරු කරන ලද වාර්ථාව.
- ගිණුම් වාර්ථාව
- පුද්ගලික හුවමාරුකිරීම් (Private Transfer)
- අන්තර් හුවමාරු කිරීම් (Intra Transfer)
- විරෝධතාවයක් නොමැති බවට නිකුත් කරන ලිපිය (No Objection Letter)

**<u>සමාගම්</u>**

- (මධ්‍යම තැන්පතුගාර පද්ධති) CDS ගිණුම් අංකය සටහන් කරන ලද අයදුම්පත.
- ගිවිසුම්
- අර්පණ ලිපිය
- ඉකුත් මාස 3ක බැංකු වාර්තා
- ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීමේ ලිපිලේඛන (KYC document) ( සමාගම සහ අධ්‍යක්ෂවරුන්ගේ)
- සංස්ථාපිත සහතිකයේ සහතික කරන ලද පිටපත.
- සංගමික ව්‍යවස්ථාවලියේ සහතික කරන ලද පිටපත
- පෝර්ම අංක 20 හි සහතික කරන ලද පිටපත
- ආන්තික වෙළෙඳ ගිණුමක් (margin trading account) ඇරඹීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය.
- අධ්‍යක්ෂවරුන්ගේ ජාතික හැඳුනුම්පත් සහතික කරන ලද පිටපත්.

**4.** <u>මූලික නියමයන් සහ කොන්දේසි</u>

- තනි කොටසක විවරණ සීමාව ආයෝජන කළඹේ අගයෙන් 33% වශයෙන් පවත්වා ගෙන යා යුතුය.
- PMF පවත්වාගෙන යා යුතු ආන්තික අවශ්‍යතා අනුපාතය වනුයේ 50%.

5. **<u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>**

- 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ 19 “අ” වගන්තිය යටතේ ආන්තික ණය සැපයුම්කරු සම්බන්ධ විධිවිධාන.
- ආන්තික ණය ගිවිසුම අනුව සේවාදායක සම්බන්ධ විධිවිධාන.

6. **<u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>**

**සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න.**

ඔබගේ ව්‍යාපාරයට ඔබින, සම්පූර්ණයෙන් සංකලනය කරන ලද මූල්‍ය විසඳුම්.

# මූලික තොරතුරු ලේඛනය

## උකස් අත්තිකාරම් ණය MORTGAGE LOAN

1. **නිමැවුමෙහි මූලික ලක්ෂණ/නිමැවුමෙහි ස්වභාවය**

**උකස් ණයක් යනු නිශ්චල වත්කමක් උකසට රඳවා ගෙන ගනුදෙනුකරුවන් හට අරමුදල් ලබා දෙන සුරක්ෂිත ණය මුදලකි.**

2. **පොලී අනුපාත/දඩ අයකිරීම්/ වෙනත් අයකිරීම්, ගාස්තු සහ කොමිස්**

- පාරිභෝගික අවදානම් පැතිකඩ සහ වෙළඳපල ප්‍රවණතා මත පදනම් වූ පොලී අනුපාතය වාර්ෂිකව 24% - 26% දක්වා

- සමාගමේ උපායමාර්ගික සැලසුම් සහ වෙළෙඳපලේ ප්‍රවණතාවන්ගේ වෙනස් වීම් මත පදනම්ව වත්කම් සහ වගකීම් කමිටුව මගින් පොලී අනුපාතය කලින්කලට දැනුම් දෙනු ලැබේ.

- ප්‍රලේඛන ගාස්තු වශයෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් අය කරනු ලැබේ.

| ණය මුදලේ ප්‍රමාණය | ප්‍රලේඛන ගාස්තු (රු.) |
|---|---|
| රු **200,000** සිට රු.**1,500,000** දක්වා | 7,500 |
| රු **1,500,001** සිට රු.**2,500,000** දක්වා | 15,000 |
| රු. **2,500,001**වඩා අධික | ණය මුදලින් 0.5% |

- කල් ඉකුත් වූ පොලී - නියමිත දිනට මාසික කල්බදු කුලිය නොගෙවන්නේ නම්, ගෙවීම් රටාව විධිමත් කරන තෙක් හිඟ මාසික වාරික සඳහා මාසයකට 4% ක් බැගින් වූ කල් ඉකුත් වූ පොලියක් අය කරනු ඇත.

3. **නිමැවුම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත**

උකස් ණය අත්තිකාරම PMF වෙතින් ලබාගැනීමට අපේක්ෂා කරන සෑම ගනුදෙනුකාර හවතෙකුම ළඟම පිහිටි ශාඛාවට පැමිණීමට හෝ සම්බන්ධ වීමට කටයුතු කළ යුතුය. ශාඛාවන්හි ඇමතුම් අංක සහ පිහිටා ඇති ස්ථාන අඩංගු ලැයිස්තුවක් අපගේ වෙබ් අඩවියේ පළකර ඇත. https://pmf.lk/en/contact-us/

<u>අවශ්‍ය කරන ලේඛන.</u>

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ඇපකරුගේ ප්‍රකාශ.
- අයදුම්කරුගේ සහ ඇපකරුගේ ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගමන් බලපත්‍රයේ/ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපතක්.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක්
- අයදුම්කරුගේ සහ ඇපකරුගේ උපයෝගිතා බිල්පත් සාක්ෂි (ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සම්බන්ධ ලිපිලේඛන) (KYC documents)
- ඉකුත් මාස හයක ඉතිරි කිරීම්/ජංගම ගිණුම් වාර්තා සහ වෙනත් ආදායම් වාර්තා.
- ඇපකරුවන්ගේ ව්‍යාපාර කටයුතු පිළිබඳ ලිඛිත සාක්ෂි සහ ආදායම් වාර්ථා.
- PMF පත්කර ඇති තක්සේරු (Panel) පැනලයේ තක්සේරු වාර්ථාව.
- PMF පත්කර ඇති නීතිඥවරුන් විසින් නිකුත් කරන ලද හිමිකම් වාර්ථාව හෝ හිමිකම් පිළිබඳ තහවුරු ප්‍රකාශය.
- හිමකම් පරීක්ෂා කිරීම මතු සඳහන් ලිපිලේඛණ
    - හිමිකම් ඔප්පුව
    - අනුමත වූ මිනින්දෝරු සැලැස්ම (මිනින්දෝරු සැලැස්ම ඉකුත් වසර 10 තුලදි සකසන ලද්දක් විය යුතුය.)
    - මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මිනින්දෝරු සැලැස්ම (තිබේ නම්)
    - නොපැවරීමේ සහතිකය.
    - වීථි රේඛා සහ ගොඩනැගිලි රේඛා සහතිකය
    - හිමිකම් සහතිකය
    - නාගරික සංවර්ධන අධිකාරියේ/මාර්ග සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතික. (අදාල වේ නම්)
    - තක්සේරු දැන්වීම් සහ අවසාන කාර්තුව තෙක් ගෙවීම් කරන ලද වරිපනම් සඳහා වූ ලදුපත්.
    - සහතික කරන ලද හිමිකම් උද්ධෘත(පත්ඉරු) (වසර 30 ක)
    - හිමිකම් රක්ෂණය (තිබේ නම්)
    - තක්සේරු කිරීමකට යටත් කරන්නේ නම් ගොඩනැගිල්ලේ අනුමත ඉදිකිරීම් සැලැස්ම.
    - ගිනි රක්ෂණ ආවරණය
    - අවශ්‍ය යැයි සැළකිය හැකි වෙනත් ලිපිලේඛන.

4. <u>**මූලික නියමයන් සහ කොන්දේසි**</u>

- දේපළෙහි බලහත්කාර විකුණුම් අගයෙන් (Forced sale value) 60% ක උපරිමයක් දක්වා ණය මුදල.
- ණය ආපසු ගෙවීමේ කාල සීමාව අවමය වසරක් විය යුතු අතර උපරිමය වසර 10ක් විය යුතුය.
- දේපළෙහි අවම වපසරිය පර්චස් 6ක් විය යුතුය.

5. <u>මෙම නිමැවුම සඳහා අදාල වන නීතිමය විධිවිධාන</u>

   - 1949 අංක 6 දරන උකස් පනත

6. **<u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>**

   **සමාගමේ පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය සඳහා මෙම ලේඛනයේ නිමාවන ස්ථානය වෙත අවධානය යොමු කරන්න**

## <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

ඔබට විශිෂ්ඨ සේවාවක් සැළැස්වීමට අපි නිරන්තරයෙන්ම ඇපකැපවී සිටින්නෙමු. ඔබගේ ප්‍රතිචාර තුලින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් දුරට ඉටුවනවාද යන්න පිළිබඳ මනා වැටහීමක් අපහට ලබාගැනීමට සහාය වන අතර, එමගින් අපගේ සේවා මට්ටම වර්ධනය කිරීමට හැකි වනවා ඇත.

ඔබගේ ප්‍රතිචාර/පැමිණිලි යොමුකරන්නේ කෙසේද:

### <u>පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටිය</u>

පාරිභෝගික **පැමිණිලි** යොමු කිරීම සඳහා, පහත සඳහන් සන්නිවේදන මාධ්‍යයන් භාවිතා කළ හැක.

- ශාඛාවක පාරිභෝගික **පැමිණිලි සඳහා නිශ්චිත නිලධාරි කෙනෙකු පත්කර ඇත. (**සෑම ශාඛාවකම **පැමිණිලි බහාලීමට පෙට්ටියක් ස්ථාන ගත කර ඇත.)**
- දුරකථන අංකය +94 117666333/0771542539
- විද්‍යුත් ලිපිනය info@pmf.lk/shyamalip@pmf.lk

මාර්ගගත විමසුම් පත සඳහා https://pmf.lk/en/contact-us/

ලිපි යොමුකරන්න:-
අනුකූලතා අංශ ප්‍රධාන,
පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සි,
අංක.361, 361/1, ආර්. ඒ. ද මෙල් මාවත,
කොළඹ - 03

සමාගමෙන් ඔබට සෑහිමට පත්විය හැකි විසඳුමක් නොලැබෙන අවස්ථාවන්හිදි, ගනුදෙනුකරුට ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත සිය පැමිණිල්ල යොමු කිරීමේ අවස්ථාව ඇත.

**<u>මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ කර ගත හැකි තොරතුරු</u> :**
සන්ධ්‍යානි විජේසිංහ මිය
මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා,
මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කායභාලය,
01, බෙතෙස්ඩා පෙදෙස
මිලාගිරිය, කොළඹ 05.
දුරකථනය +94 11 2595624
ෆැක්ස් +94 11 2595625
විද්‍යුත් තැපැල fosril@sltnet.lk
වෙබ් අඩවිය www.financialombudsman.lk

**<u>මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි තොරතුරු</u> :**

මූල්‍ය  පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01
විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් අංකය: 1935
දුරකථනය: +94 112477966
ෆැක්ස් : +94 112477444
විද්‍යුත් තැපැල : fcrd@cbsl.lk